# කර්මාන්ත

**සමස්ත උපනතීන්**

කර්මාන්ත නිමැවුමේ වටිනාකම 1987 වර්ෂයේදී සියයට 8 ක මූර්ත වර්ධනයක් පෙන්නුම් කළ අතර, පසුගිය වසරේ එය සියයට 12 ක් විය. වර්ෂය තුළදී පෞද්ගලික අංශයේ කර්මාන්ත නිමැවුම මූර්ත වශයෙන් සියයට 15 කින් වැඩි වූ අතර, රාජ්‍ය අංශයේ නිමැවුම සියයට 1 කින් පහත වැටුණි.

1987 වර්ෂයේ කර්මාන්ත නිමැවුමේ වර්ධන වේගය සාමාන්‍ය මට්ටමකට පත්වීමට ප්‍රධාන හේතුව වූයේ, රාජ්‍ය අංශයේ නිමැවුමේ පහත වැටීමයි. ජාතික පේෂකර්ම සංස්ථාවේ නිමැවුම පහත වැටීම සහ ඛනිජ තෙල් නිමැවුම බොහෝදුරට නොවෙනස් තත්ත්වයක පැවතීම රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුමේ පහත වැටීමට තුඩු දුනි. රටේ පැවැති කලබලකාරී තත්ත්වයන් රාජ්‍ය කාර්මික සංස්ථා කීපයකම නිෂ්පාදන හා බෙද හැරීමේ කටයුතුවලට අහිතකර ලෙස බලපෑවේය.

පෞද්ගලික අංශයේ නිෂ්පාදන අංශ අතර රෙදිපිළි හා ඇඟළුම්, සකස් කළ ලෝහ නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත යන අංශයන්හි නිෂ්පාදනයේ විශාල වැඩි වීම් වාර්තා වී තිබුණි. පංගු උපයෝජනය ඉහළ මට්ටමක පවත්වා ගැනීම සහ වැඩි එකතු කළ අගයන් ඇති නිෂ්පාදිත කෙරෙහි නැඹුරුවීම මගින් රෙදිපිළි හා ඇඟළුම් අංශයට තම නිෂ්පාදන වැඩිවීමේ උපනතිය දිගටම පවත්වාගෙන යාමට හැකි විය. රෙදිපිළි හා ඇඟළුම් අපනයනයන් මුළු කාර්මික අපනයන වලින් සියයට 65 කට පමණ දායක වූ අතර විගැහි වටිනාකම් අනුව මුළු කාර්මික අපනයන වටිනාකම 1987 දී සියයට 9 කින් ඉහළ ගියේය.

1987 දී රජය විසින් නව කාර්මික සංවර්ධන උපාය මාර්ගයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, රටේ අනාගත කාර්මික ප්‍රතිපත්තිය තීරණය කිරීමේ කාර්යය සඳහා ඇමතිවරුන්ගෙන් සමන්විත කාර්මික සංවර්ධන සභාවක් පිහිටුවනු ලැබීය. එසේම පෞද්ගලීකරණ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 1987 දී ජනාධිපති කොමිසමක් පත් කරනු ලැබූ අතර, එහි ප්‍රධාන කාර්යයන් වූයේ (අ) ප්‍රතිපත්ති සම්පාදනය, (ආ) පෞද්ගලිකරණය සඳහා සුදුසු ව්‍යවසායයන් හඳුනා ගැනීම සහ (ඇ) පෞද්ගලීකරණ ක්‍රියාදමය පහසු කරවීම යන කරුණුය. ඒ අතර තීරු බදු ප්‍රතිපත්තිය තවදුරටත් දේශීය කර්මාන්ත ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී තත්ත්වයකට ගෙන ඒමේ අරමුණින් ක්‍රියාත්මක වුණි.

**ආයෝජන**

කාර්මික අංශයේ ආයෝජන 1987 වර්ෂයේදී තවදුරටත් සිදු විය. දේශීය ආයෝජන උපදේශක කමිටු (දේ. ආ. උ. ක.) පසුගිය වර්ෂයේ ව්‍යාපෘති 321 සමග සසඳන විට 1987 දී ව්‍යාපෘති 364 ක් අනුමත කළේය. අනුමත ව්‍යාපෘතිවල අපේක්ෂිත මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 530 ක් වන අතර, අපේක්ෂිත සේවා නියුක්තිය පුද්ගලයින් 14,594 කි.

විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි. ආ. උ. ක.) 1987 වර්ෂයේ කාර්මික ව්‍යාපෘති 41 ක් අනුමත කළේය. පසුගිය වර්ෂයේ අනුමත ව්‍යාපෘති සංඛ්‍යාවද 41 ක්ම විය. මේ ව්‍යාපෘතිවලින් රුපියල් දශ ලක්ෂ 672 ක් මුළු ආයෝජනය වශයෙන් අපේක්ෂා කළ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 190 ක් විදේශ ආයෝජන වේ. මේවායින් ව්‍යාපෘති 10 ක් රෙදිපිළි හා ඇඟළුම් අංශයේ විය. අපේක්ෂිත මුළු සේවා නියුක්තිය පුද්ගලයින් 5,037 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත.

මහ කොළඹ ආර්ථික කොමිසම (ම. කො. ආ. කො.) 1987 වර්ෂයේදී අනුමත කළ ව්‍යාපෘති ගණන 31 කි. ම. කො. ආ. කො. 1986 දී අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව 10 කි. එම ව්‍යාපෘති-වල අපේක්ෂිත මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 812 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ

592 ක් විදේශීය ආයෝජන විය. මුළු සේවා නියුක්ති උත්පාදනය පුද්ගලයින් 8,970 ක් ලෙසට ඇස්තමේන්තු කෙරුණි. 1987 අග වනවිට, ම. කො. ආ. කො. හි අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව 252 ක් වූ අතර, එයින් 138 ක් ම. කො. ආ. කො. සමඟ කර්මාන්ත පිහිටුවීමට ගිවිස ගෙන ඇත.

**නිෂ්පාදනය**

1987 වර්ෂයේ කාර්මික නිමැවුම් වටිනාකම මූර්ත වශයෙන් සියයට 8 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 1986 දී මෙම වර්ධන වේගය සියයට 12 ක් විය. 1987 දී කර්මාන්ත නිමැවුමේ වර්ධනය තනිකරම පෞද්ගලික අංශය මත සංකේන්ද්‍රණය වී ඇත.

1987 නිමැවුමේ වර්ධනයන් වාර්තා කළ උප අංශ අතර රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත (සියයට 23); ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 11); මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 11); සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 9); දැව හා දැව නිෂ්පාදිත (සියයට 4); රසායනික නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත (සියයට 3 බැගින්) සහ කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 1) වැදගත් වේ.

රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදිත අංශයෙහි වූ කැපී පෙනෙන සමස්ත වර්ධනයට බොහෝ සෙයින් දායක වූයේ, අපනයනාභිමුඛ ඇඟළුම් කර්මාන්තයෙහි (ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ සහ ඉන් පිටත) වූ සැළකිය යුතු වර්ධනයයි. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත අංශය තුළ පෞද්ගලික අංශයේ කර්මාන්තයන් විශේෂයෙන් දුම්කොළ, කිරි නිෂ්පාදිත, පාන වර්ග, සීනි, රස කැවිලි, විස්කෝතු සහ මස් නිෂ්පාදිත වැනි නිෂ්පාදිතයන් ගණනාවක් ඉහළ නිමැවුම් මට්ටම් වාර්තා කර තිබීම විශේෂ ලක්ෂණයකි. දැව හා දැව නිෂ්පාදිතයන්හි වූ වර්ධනය ප්‍රධාන වශයෙන්ම පෞද්ගලික අංශය මත රඳා පැවති අතර, රාජ්‍ය අංශයේ නිමැවුම බොහෝදුරට නොවෙනස්ව පැවතුණි. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත අංශයේ නිමැවුම ආන්තික වශයෙන් වැඩි වීමට බොහෝ සෙයින් බලපෑවේ, ජාතික කඩදාසි සංස්ථාවේ වූ ඉහළ නිමැවුම් මට්ටමයි. පෞද්ගලික අංශයේ කර්මාන්තයන් විශේෂයෙන් තීන්ත, බෙහෙත් වර්ග, පොලිතීන්, සබන්, දත් බෙහෙත්, කෘමි නාශක සහ පලිබෝධ නාශක, රබර් භාණ්ඩ, ග්ලිසරීන් සහ ප්ලාස්ටික් භාණ්ඩ යනාදී නිෂ්පාදිතවල නිමැවුම් වටිනාකම ඉහළ යාම හේතුකොට ගෙන රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත අංශයේ නිමැවුමේ වැඩි වීමක් වාර්තා විය.

ප්‍රධාන සංස්ථාවන් පිළිබඳව සළකා බැලීමේදී පෙනී යන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිමැවුම් මට්ටම ආන්තික වශයෙන් ඉහළ නැඟ ඇති අතර, ශ්‍රී ලංකා ටයර් සංස්ථාවේ නිෂ්පාදනය සැළකිය යුතු ප්‍රමාණයකින් පහත වැටී ඇති බවයි. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන අංශයේ වූ ප්‍රගතියට රාජ්‍ය පතල් කැණීම් හා ඛනිජ සංවර්ධන සහ ශ්‍රී ලංකා සිමෙන්ති යන සංස්ථාවන්හි නිමැවුම් වර්ධනය විශාල වශයෙන් බලපා ඇත. පෞද්ගලික අංශයෙන්ද පිඟන් ගඩොල්, ඇස්බැස්ටෝස් සහ සිමෙන්ති නිෂ්පාදිත ඉහළ නිමැවුම් මට්ටමක් වාර්තා කර ඇත. මූලික ලෝහ නිෂ්පාදිත අංශයේ නිමැවුම වැඩි වීමට හේතුවූ ප්‍රධානම සාධකය වූයේ, ලංකා වානේ සංස්ථාවේ නිමැවුම වැඩිවීමයි. ජලනල, විදුලි බුබුළු, උඳුන්, ශීතකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනයේ නියැලීමෙන් පෞද්ගලික අංශයේ නිමැවුමේ වූ වර්ධනය, සකස් කළ ලෝහ නිෂ්පාදිත අංශයේ දක්නට ලැබුණු ප්‍රගතියට බොහෝසෙයින් බලපෑවේය.

1987 කර්මාන්ත නිමැවුම වර්තන වටිනාකම අනුව සියයට 17 කින් වැඩිවී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. 1987 වර්ෂයේදී රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදිත සියයට 28 කින්ද; රසායනික ද්‍රව්‍ය සහ ඛනිජ තෙල් සියයට 22 කින්ද; සකස් කළ ලෝහ නිෂ්පාදිත සියයට 14 කින්ද; මූලික ලෝහ නිෂ්පාදිත සියයට 9 කින්ද; ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත සහ දැව හා දැව නිෂ්පාදිත සියයට 7 බැගින්ද; කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සියයට 6 කින් සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සියයට 5 කින්ද වශයෙන් නිමැවුම් වැඩිවී ඇත.

## 1 . 15 සංඛ්‍යා සටහන
## කාර්මික නිෂ්පාදන වටිනාකම 1983 – 1987 (වර්තන මිල අනුව)

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | 1983 | 1984 | 1985 | 1986 | 1987 (අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 6,998 | 8,623 | 10,497 | 12,129 | 12,962 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 5,136 | 7,565 | 9,505 | 12,088 | 15,428 |
| 3. දව හා දව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 522 | 640 | 705 | 632 | 677 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | 901 | 907 | 1,187 | 1,289 | 1,372 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 11,888 | 14,328 | 13,104 | 11,088 | 13,477 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 1,468 | 1,829 | 1,854 | 2,053 | 2,156 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 302 | 199 | 123 | 281 | 307 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. | 1,129 | 1,456 | 1,592 | 1,757 | 2,006 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත .. | 90 | 106 | 125 | 136 | 155 |
| එකතුව .. | 28,434 | 35,653 | 38,692 | 41,453 | 48,540 |

(අ) තාවකාලික — මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

### රාජ්‍ය අංශයේ කර්මාන්ත


මූර්ත වටිනාකම් අනුව බලන කල, පසුගිය වර්ෂයේ වූ සියයට 8 ක වර්ධනය හා සැසඳීමේදී, 1987 වර්ෂයේදී රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 1 කින් පහත වැටුණි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං. ඛ. සං.) සහ ජාතික පේෂකර්ම සංස්ථාව (ජා. පේ. සං.) රාජ්‍ය අංශයේ මුළු කාර්මික නිමැවුමෙන් සියයට 62 කට දායක විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිෂ්පාදනය බොහෝ දුරට නොවෙනස්ව පැවැති අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, නඩත්තු කටයුතු සඳහා පිරිපහදුව වසා තැබීමයි. ජාතික පේෂකර්ම සංස්ථාව සම්බන්ධයෙන් බලන කල රටේ පැවති කලබලකාරී තත්ත්වයන් සහ විදුලි බල සීමා පැනවීම් හේතුවෙන් වැඩ කරන පැය ප්‍රමාණය අඩු වීම නිසා එහි නිමැවුමේ අඩු වීමක් ඇති විය.

## 1 . 16 සංඛ්‍යා සටහන
## රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය (1977=100)

| කාර්මික ගණය | 1985 | 1986 | 1987(අ) |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 48·6 | 46·6 | 40·8 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 185·9 | 208·0 | 200·0 |
| 2.1 රෙදිපිළි .. | 249·9 | 279·0 | 271·4 |
| 3. දව හා දව නිෂ්පාදිත .. | 139·3 | 103·4 | 103·8 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | 142·8 | 160·6 | 167·8 |
| 5. රසායනික නිෂ්පාදිත .. | 109·5 | 114·9 | 115·3 |
| 5.1 ඛනිජ තෙල් නිෂ්පාදිත .. | 109·1 | 115·3 | 115·9 |
| 5.2 ටයර් .. | 130·2 | 136·4 | 130·3 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත .. | 103·9 | 132·7 | 142·3 |
| 6.1 සිමෙන්ති .. | 105·2 | 154·4 | 171·3 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 40·5 | 64·1 | 71·1 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත .. | 101·8 | 136·8 | 98·8 |
| සියළුම කාර්මික ගණයන් .. | 108·1 | 116·2 | 115·4 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත හැර .. | 106·9 | 117·0 | 114·8 |

(අ) තාවකාලික — මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව,

# රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් දර්ශකය




ශ්‍රී ලංකා මහ බැංකුව.

රාජ්‍ය සංස්ථාවන්ගේ නිෂ්පාදන මට්ටම්වල සැළකිය යුතු ලෙස වෙනස්කම් සිදු වී ඇත. නිමැවුමේ අඩුවීම් වාර්තා කළ සංස්ථාවන් වූයේ ශ්‍රී ලංකා සීනි (සියයට 24), රාජ්‍ය ස්කාගාර (සියයට 21), බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් (සියයට 16), ලංකා පිඟන් කර්මාන්ත (සියයට 7), ශ්‍රී ලංකා ටයර් (සියයට 4), ජාතික පේෂකර්ම (සියයට 3), ලංකා සම් භාණ්ඩ (සියයට 3) සහ රාජ්‍ය ලෝහ භාණ්ඩ (සියයට 32) යනාදියයි.

නැගෙනහිර පළාතේ පැවති කලබලකාරී තත්ත්වයන් සහ නියඟය සීනි නිෂ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇති කළේය. පිඟන් කර්මාන්ත සංස්ථාවේ නිමැවුම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කම්කරුවන් සේවයට වාර්තා කිරීම විශාල ලෙස අඩු වීම සහ සංස්ථාවට අයත් මීගමුව කම්හල අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කටයුතු සඳහා මාස 2 1/2 කට ආසන්න කාලයක් වසා තිබීමයි. නැව්ගත කරන ලද බඩු තොග ප්‍රමාද වී පැමිණීම හේතුකොටගෙන 1987 වර්ෂයේ අවසන් භාගයේදී ඇති වූ අමු ද්‍රව්‍ය හිඟයක ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ නිමැවුම පහත වැටුණි. රාජ්‍ය ස්කාගාර සංස්ථාවද නිමැවුමේ පහත වැටීමක් වාර්තා කළේය. රා එකතු කෙරෙන ප්‍රදේශවල පැවති නියඟය හේතුවෙන් රා නිෂ්පාදනය විශාල ලෙස අඩු වීම මෙයට බලපෑ කරුණ විය. එසේම උතුරු හා නැගෙනහිර පළාත්වල විකුණුම් කටයුතුවලට බාධා ඇති වීම නිසාද ස්කාගාර සංස්ථාවට සිය නිෂ්පාදනය අඩු කිරීමට සිදු විය. ශ්‍රී ලංකා ටයර් සංස්ථාවේ නිමැවුම අඩු වීම, අලෙවිකරණ ප්‍රශ්න නිසා උද්ගත වූවකි.

නිමැවුම්හි වැඩි වීම් වාර්තා කරනු ලැබූ කාර්මික ව්‍යවසායයන් ලෙස තෙල් හා මේද (සියයට 89), රාජ්‍ය පතල් කැණීම සහ ඛනිජ සංවර්ධන (සියයට 34), රාජ්‍ය දැව (සියයට 19), ශ්‍රී ලංකා සිමෙන්ති (සියයට 11), ජාතික ලුණු (සියයට 10), ජාතික කඩදාසි (සියයට 5) සහ ලංකා වානේ (සියයට 11) යන සංස්ථා සහ සීමාසහිත රබර් නිෂ්පාදන සමාගම (සියයට 18) දැක්විය හැකිය.

පෞද්ගලික අංශයේ ආයතන මගින් නිෂ්පාදනය කරනු ලැබූ ආදේශකයන්හි මිළ මට්ටම ඉහළ යාම නිසා, විශේෂයෙන්ම සත්වාහාර සඳහා ඇති වූ ඉල්ලුමේ වැඩි වීම නිසා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලයේ නිමැවුම සැළකිය යුතු ලෙස ඉහළ ගියේය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැව කැපීම සඳහා අමතර බිම් ප්‍රමාණයක් මුදා හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1987 වසරේ රාජ්‍ය දැව සංස්ථාවේ නිමැවුම වැඩි විය. යබොර කැට (ක්ලින්කර්) ආනයන වැඩි වීම නිසා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ නිමැවුම ඉහළ ගියේය. ක්‍රෙප් රබර් සඳහා ඉහළ මිළ ගණන් ලැබීම සහ වඩා හොඳ දේශගුණික තත්ත්වයන් යටතේ රබර් කිරි එකතු කර ගැනීම පහසු වීම සීමාසහිත රාජ්‍ය රබර් නිෂ්පාදන සමාගමේ නිමැවුම වැඩි වීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය.

1987 වසර තුළදී සංස්ථා බොහොමයකට ලාභ උපදවා ගැනීමට හැකි විය. 1987 වසරේ ලාභ පෙන්වූ ව්‍යවසායයන් වශයෙන් රාජ්‍ය ස්කාගාර (රුපියල් දශ ලක්ෂ 78), රාජ්‍ය දැව (රුපියල් දශ ලක්ෂ 55), ජාතික කඩදාසි (රුපියල් දශ ලක්ෂ 43), ශ්‍රී ලංකා ටයර් (රුපියල් දශ ලක්ෂ 53), ලංකා ඔක්සිජන් (රුපියල් දශ ලක්ෂ 14), කොළඹ ගෑස් සහ ජල සමාගම (රුපියල් දශ ලක්ෂ 43), ශ්‍රී ලංකා සිමෙන්ති (රුපියල් දශ ලක්ෂ 138), ලංකා ඛනිජ වැලි (රුපියල් දශ ලක්ෂ 68), රාජ්‍ය පතල් කැණීම් හා ඛනිජ සංවර්ධන (රුපියල් දශ ලක්ෂ 21) සහ ලංකා වානේ (රුපියල් දශ ලක්ෂ 6) යන සංස්ථා දැක්විය හැකිය.

## 1 . 17 සංඛ්‍යා සටහන

## කාර්මික ව්‍යවසායයන්ට කෙරුණු රාජ්‍ය අරමුදල් සංක්‍රාම 1985 – 1987

රුපියල් දශ ලක්ෂ

| සංස්ථාව/ව්‍යවසායය | ප්‍රාග්ධන | | | වර්තන | | | මුළු ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1985 | 1986 | 1987 (අ) | 1985 | 1986 | 1987 (අ) | 1985 | 1986 | 1987 (අ) |
| 1. ජාතික කිරි මණ්ඩලය .. | 10·3 | 3·2 | 2·5 | 50·0 | 95·9 | — | 60·3 | 99·1 | 2·5 |
| 2. තෙල් හා මේද .. | 6·0 | — | — | — | 7·1 | — | 6·0 | 7·1 | — |
| 3. ශ්‍රී ලංකා සීනි .. | 508·3 | 131·0 | 195·0 | — | 127·1 | 42·0 | 508·3 | 258·1 | 237·0 |
| 4. ජාතික පේෂකර්ම .. | — | 42·0 | 42·0 | 30·4 | 29·1 | — | 30·4 | 71·1 | 42·0 |
| 5. ජාතික කඩදාසි .. | — | — | — | 27·1 | 7·7 | 8·0 | 27·1 | 7·7 | 8·0 |
| 6. රාජ්‍ය පොහොර නිෂ්පාදන .. | — | — | — | 43·0 | 26·3 | — | 43·0 | 26·3 | — |
| 7. රාජ්‍ය මුද්‍රණ .. | 3·7 | — | — | — | — | — | 3·7 | — | — |
| 8. සී. ස. ලංකා ඔක්සිජන් .. | — | — | — | 7·6 | — | — | 7·6 | — | — |
| 9. ජාතික ඇසුරුම් ද්‍රව්‍ය .. | — | — | — | — | 4·0 | — | — | 4·0 | — |
| මුළු එකතුව .. | 528·3 | 176·2 | 239·5 | 158·1 | 297·2 | 50·0 | 686·4 | 473·4 | 289·5 |

(අ) අනුමත ඇස්තමේන්තු

මූලය : මහා භාණ්ඩාගාරය.

ඇස්තමේන්තුවලට අනුව වසර තුළදී රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්ට කෙරුණු රාජ්‍ය අරමුදල් සංක්‍රාමයන්හි වටිනාකම රුපියල් දශ ලක්ෂ 290 ක් විය. මෙය, රුපියල් දශ ලක්ෂ 240 (සියයට 83) ක ප්‍රාග්ධන සංක්‍රාම වලින් සහ ඉතිරි රුපියල් දශ ලක්ෂ 50 (සියයට 17) ක වර්තන සංක්‍රාමයන්ගෙන් සමන්විත විය. ශ්‍රී ලංකා සීනි සංස්ථාව විසින් රුපියල් දශ ලක්ෂ 237 ක් එනම්, රාජ්‍ය අංශයේ කර්මාන්තවලට 1987 වසරේදී කරන ලද මුළු රාජ්‍ය සංක්‍රාම වලින් සියයට 82 ක්ම ලබා ගත්තේය. ජාතික පේෂකර්ම, ජාතික කඩදසි සහ ජාතික කිරි මණ්ඩලය (සීමාසහිත මිල්කෝ ලෙස පෞද්ගලීකරණය කරන ලද) සෙසු සංක්‍රාමලාභීන් විය. රාජ්‍ය අංශයේ කර්මාන්තවලට කරන ලද සංක්‍රාම ගෙවීම් සැළකිය යුතු ලෙස පහත වැටීම, මෑත වසරවල සිට රාජ්‍ය අංශයේ කර්මාන්ත රජයේ අයවැය මත රඳා පැවැතීම අඩු වීමේ උපනතිය තවදුරටත් පෙන්නුම් කරයි.

### බලශක්ති හා ඉන්ධන

ලංකා විදුලි බල මණ්ඩලය හැර කර්මාන්ත වලට අලෙවි කරනු ලැබූ ඉන්ධන ප්‍රමාණය 1987 දී සියයට 21 කින් වැඩි විය. උදුන් තෙල් අලෙවිය සියයට 25 කින් වැඩිවූ අතර, බැර ඩීසල් අලෙවිය වර්ෂය තුළදී සියයට 6 කින් පහත වැටුණි.

1987 අගෝස්තු–සැප්තැම්බර් මාස තුළදී විදුලිය කපා හැරීම නිසා 1987 වර්ෂයේ කර්මාන්තයන්හි විදුලිය භාවිතය සියයට 5 කින් පහත වැටුණි. 1987 වර්ෂයේදී මධ්‍යම හා කුඩා පරිමාණ කාර්මික ගණයන්හි විදුලිය භාවිතය පිළිවෙලින් සියයට 9 කින් හා සියයට 2 කින් වැඩි විය. කෙසේ වුවද, වර්ෂය තුළදී විශාල පරිමාණයේ කර්මාන්තයන්හි විදුලිය පරිභෝජනය සියයට 13 කින් පහත වැටුණි.

## 1 . 18 සංඛ්‍යා සටහන

### කර්මාන්තයන්හි බල හා ඉන්ධන භාවිතය

| ශීර්ෂය | 1985 | 1986 | 1987 (අ) |
|---|---|---|---|
| 1. විදුලි බලය (ගිග වොට් පැය) .. | 850·4 | 925·3 | 879·0 |
| 1·1 කුඩා පරිමාණ කර්මාන්ත* .. | 34·7 | 35·6 | 38·7 |
| 1·2 මධ්‍යම පරිමාණ කර්මාන්ත* .. | 411·4 | 444·8 | 451·8 |
| 1·3 විශාල පරිමාණ කර්මාන්ත* .. | 404·3 | 444·9 | 388·5 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය අලෙවිය (ආ) (මෙට්‍රික් ටොන් දහස්) .. | 163·2 | 149·5 | 180·3 |
| 2·1 බැර ඩීසල් .. | 2·3 | 19·8 | 18·6 |
| 2·2 උඳුන් තෙල් .. | 142·9 | 129·7 | 161·7 |

මූලයයන් : ලංකා විදුලි බල මණ්ඩලය;
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

(අ) තාවකාලික.

(ආ) ලංකා විදුලි බල මණ්ඩලයට කෙරුණු විකිණීම් හැර.

* කාර්මික නිෂ්පාදන සහ අපනයන සැකසුම් කර්මාන්තද ඇතුළත්ය. කිලෝවෝල්ත ඇම්පියර් 50 ට අඩු ධාරිතාවයක් ඇති ඒවා කුඩා පරිමාණ කර්මාන්ත වශයෙන්ද, කිලෝවෝල්ත ඇම්පියර් 50-500 අතර ධාරිතාවයක් ඇති ඒවා මධ්‍යම පරිමාණ කර්මාන්ත වශයෙන්ද, කිලෝවෝල්ත ඇම්පියර් 500 ට වැඩි ධාරිතාවයක් ඇති ඒවා විශාල පරිමාණ කර්මාන්ත වශයෙන්ද නිර්වචනය කෙරේ.

### ආයෝජන ප්‍රවර්ධන කලාපය

1987 වසරේදී මහ කොළඹ ආර්ථික කොමිසම (ම. කො. ආ. කො.) විසින් ව්‍යාපෘති 31 ක් අනුමත කිරීමත් සමගම, 1987 වසර අවසන් වනවිට අනුමත කරනු ලැබූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 252 ක් විය. මෙයින් ව්‍යාපෘතීන් 138 ක් කර්මාන්ත ආරම්භ කිරීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම සමග ගිවිසුම් අත්සන් කොට තිබිණි. කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය (ක. ආ. ප්‍ර. ක.) තුළ වාණිජමය නිෂ්පාදන කටයුතුවල නිරත වූ මුළු ව්‍යවසාය-යන්ගේ සංඛ්‍යාව 70 ක් වූ අතර, තවත් ව්‍යවසායයන් 21 ක් ඉන් පිටත නිෂ්පාදන කටයුතුවල නිරතව සිටියහ. වර්ෂය අවසානයේදී බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ ව්‍යවසායයන් 5 ක් කාර්මික නිෂ්පාදනයේ නියැලී සිටියහ. ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘති අතරින් 41 ක් මසා නිම කළ ඇඳුම් සහ ඊට සම්බන්ධ නිෂ්පාදනයන්හි නිරත විය.

1987 වසරේ ම. කො. ආ. කො. අනුමත කළ ව්‍යාපෘතීන් අතර, කජු, දුම්කොළ, පළතුරු හා එළවළු සැකසීම, දියමන්ති හා මැණික් කැපීම හා සැකසීම, හිස් වැසුම්, ඇඳුම් පැළඳුම්, කැන්වස් මලු, ලී කැටයම්, සක්‍රිය කාබන්, තාක්ෂණිකව විශේෂණය කරන ලද රබර් (ටී. එස්. ආර්.), සියුම් යන්ත්‍රෝපකරණ කොටස් සෑදීමේ අච්චු, පාපැදි රාමු සඳහා අමතර කොටස්, ධීවර කර්මාන්තය හා සම්බන්ධ ආම්පන්න, කොසු හා බුරුසු, ගුවන් විදුලි යන්ත්‍ර කොටස්, ඇස් කන්නාඩි, පුරවන ලද සැහැල්ලු සෙල්ලම් බඩු, සුවඳ විලවුන් හා චිත්‍ර ශිල්පී බුරුසු, අලංකාරයට වවන මල්පැලෑටි හා කපන ලද මල්, දන්ත සැකසීමේ පද්ධති, ගුවන් විදුලි සහ රූපවාහිනී යන්ත්‍ර සකස් කිරීම, කම්බි සහිත හා රහිත දුරකථන නිෂ්පාදනය කිරීම යනාදිය ඇතුළත් වේ.

1987 වසරේ ම. කො. ආ. කො. හි අපනයන ඉපැයීම් වන රුපියල් දශලක්ෂ 7,731 (විගැහි දශ ලක්ෂ 203) 1986 වසරට වඩා සියයට 43 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. විගැහි වටිනාකම අනුව එය සියයට 22 ක වැඩි වීමක් පිළිබිඹු කරයි. පසුගිය වසරේ මෙන්ම, අපනයන ඉපයීම් වලින් සියයට 80 කට ආසන්න ප්‍රමාණයක් රෙදිපිළි හා මසා නිම කළ ඇඟලුම් වලින් ලැබිණි.

## 1 : 19 සංඛ්‍යා සටහන

## ආයෝජන ප්‍රවර්ධන කලාපය–සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1986–1987

| කාර්මික ගණය | 1986 | | 1987 | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට ගණන) | දළ අපනයන ඉපැයුම් (නැ. වි. ස.) (රු. ද. ල.) | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට ගණන) | දළ අපනයන ඉපැයුම් (නැ. වි. ස.) (රු. ද. ල.) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 471 | 38·8 | 641 | 144·7 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 33,937 | 4,369·8 | 38,343 | 6,100·1 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 24 | 1·3 | 56 | 4·0 |
| 4. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 1,655 | 287·1 | 1,649 | 262·0 |
| 5. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 1,648 | 210·8 | 2,132 | 317·4 |
| 6. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 149 | 79·7 | 435 | 176·7 |
| 7. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 3,237 | 199·7 | 3,683 | 444·8 |
| 8. සේවා (ආ) | 493 | 208·5 | 534 | 281·8 |
| එකතුව | 41,614 | 5,395·7 | 47,473 | 7,731·5 |

(අ) තාවකාලික.
(ආ) 'එයාර් ලංකා සමාගම' හැර.

මූලය : මහ කොළඹ ආර්ථික කොමිසම.